# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2022 ජූලි

## (102) ව්‍යාපාරික ගණිතය සහ සංඛ්‍යානය

(Business Mathematics & Statistics)

මෙම ප්‍රශ්න පත්‍රය **A, B** සහ **C කොටස** ලෙස කොටස් 3 කින් සමන්විත වේ.

**A කොටස** අනිවාර්ය වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQ), 15 කින් යුක්ත විය. **1.1** සිට **1.10** දක්වා බහුවරණ ප්‍රශ්න 10 ක් සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 3 බැගින් ලකුණු 30 ක් ද, **1.11** ප්‍රශ්නය සඳහා ලකුණු 4 ක් ද, **1.12** සහ **1.13** කෙටි ප්‍රශ්න සඳහා ලකුණු 2 බැගින් ද **1.14** සහ **1.15** ප්‍රශ්න සඳහා ලකුණු 1 බැගින් ද, **A කොටසේ** මුළු ලකුණු 40 බෙදා වෙන් කරන ලදී.

මෙම **1 වන ප්‍රශ්නයේ** එක් එක් අනු කොටස් සඳහා අයදුම්කරුවන් ලබාදී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ**:**

## <u>A - කොටස</u>

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ අනු කොටස්වලට දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා හා නිරීක්ෂණ පහත දැක්වේ:

1.1 වර්ගජ ශ්‍රිතය සඳහා සමාන ඒකජ සංඛ්‍යා දෙකක ගුණිතය නිවැරදිව ලබා ගැනීම මෙහිදී අපේක්ෂා කළ අතර, දී ඇති වර්ගජ ශ්‍රිතයේ $x^2$ සාධකය ඍණ බැවින් එම ඍණ අගය සාධකයක් ලෙස පිටතට ගෙන,

$-(5x^2 + 4x - 12) = (5x - 2)(x + 2)$ ලබා ගැනීම බොහෝ සිසුන් සිදුකර නොතිබුණි.

දී ඇති උත්තර අතරින් $x^2$ සංගුණකය -5 වන උත්තර දෙක අතරින් නියත පදයේ සංගුණකය +12 වන පිළිතුර පහසුවෙන් තෝරා ගත හැකිව තිබුණි.

1.2 වැල් පොලිය ආශ්‍රිත ගැටළුවකි. $A = P(1 + r)^n$ සූත්‍රය මගින් පහසුවෙන් උත්තරය ලබා ගත හැකිය. නමුත් සමහර අයදුම්කරුවන් වැල් පොලිය වෙනුවට සුළු පොලී සූත්‍රය යොදා පොලිය රු.10,500/- ලෙස වැරදි උත්තර තෝරාගෙන තිබුණි. මෙවැනි දෝෂ සිදුවීමට ප්‍රධාන හේතුව විභාගයට පෙර ස්ව-අධ්‍යයන කට්ටල හා පසුගිය ප්‍රශ්න පත්‍ර හොඳින් අධ්‍යයනය නොකිරීමයි.

1.3 $y = 0.33 + 0.667x$ ලෙස ප්‍රතිපායන රේඛාවේ සමීකරණය ලබාදී තිබූ අතර, එය 1,000 ඒවායෙන් දැක්වෙන්නේ යැයි දී තිබුණි. ඒ අනුව $x$ සඳහා ආදේශ කිරීමේදී 250,000 වෙනුවට 250 යොදා ගත යුතුය. නමුත් අයදුම්කරුවන් අතුරෙන් බහුතරයක් $x = 250,000$ ලෙස යොදා උත්තරය ලෙස රු.166,750/- ලෙස තෝරාගෙන තිබුණි. නිවැරදි උත්තරය විය යුත්තේ රු.167,080/- වේ.

ගැටළුවේ දී ඇති දත්ත හොඳින් කියවා තේරුම් නොගැනීම මීට ප්‍රධාන හේතුව විය.

1.4 2020 වර්ෂය පාදක වර්ෂය ලෙස ගෙන ප්‍රමාණ සාපේක්ෂය සෙවීම මෙහිදී අපේක්ෂා කෙරේ. මෙහිදී සමහර අයදුම්කරුවන් 2021 පාදක වර්ෂය ලෙස ගෙන තිබීම ඉතා කණගාටුදායක වේ. මෙවැනි ප්‍රමාණ සාපේක්ෂය (quantity relative) සෙවීමේදී අදාල පාදක වර්ෂයට අදාල ප්‍රමාණය හරයට ගෙන අදාල වර්ෂයේ ප්‍රමාණය ලවයට ගෙන එය ප්‍රතිශතයක් ලෙස දැක්විය යුතුය.

$$\text{ප්‍රමාණ සාපේක්ෂය} = \frac{q_1}{q_0} \times 100$$

1.5 සම්භාවිතාවය ආශ්‍රිත ගැටළුවකි. පළමුව ගන්නා බෝලය නැවත පෙට්ටිය තුලට දමා පිළිවෙලින් නිල් බෝලයක් සහ කොල බෝලයක් ගැනීමේ සම්භාවිතාවය විමසා තිබුණි. කෙසේවෙතත්, ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගත් අයදුම්කරුවන් විවිධ වැරදි උත්තර තෝරා තිබුණි.

1.6 සංඛ්‍යානයේ එන සමූහික සංඛ්‍යාත ව්‍යාප්තියක කේන්ද්‍රික ප්‍රවණතා මිනුමක් වන මධ්‍යස්ථය සෙවීම මෙහිදී අපේක්ෂා කර තිබුණි.

$$\text{සමූහිත දත්ත සඳහා : } M_d = L_1 + \left(\frac{\frac{n}{2} - F_c}{f_m}\right) \times C$$

සූත්‍රයේ $L_1$ තෝරාගැනීමේදී දී ඇති පන්ති සංතතිය නොවන පරිදි ඇති නිසා මධ්‍යස්ථ පන්තිය අදාල පන්ති මායිම් සැලකිය යුතුය. ඒ අනුව සමුච්චිත සංඛ්‍යාත තීරුවක් සම්පූර්ණ කර එහි මධ්‍යස්ථයට අදාල පන්තියේ පහළ පන්ති මායිම ලෙස $L_1$ ගැනීම සිදුකළ යුතු වුවත් විශාල අයදුම්කරුවන් පිරිසක් එසේ සලකා නොතිබුණි. මෙහිදී මධ්‍යස්ථය අඩංගු පන්තිය 27.5 - 35.5 ලෙස සකස් කර ගත යුතු අතර, දී ඇති වරණ 4 ම ඉහත පන්තියට අදාල නිසා සම්පූර්ණ සූත්‍රය ආදේශයෙන් තොරව නිවැරදි උත්තරය ලබාගත නොහැක.

1.7 ගුණෝත්තර ශ්‍රේණි ආශ්‍රිත ගැටළුවකි. පොදු අනුපාතය r ද, මුල් පදය a ද වූ ගුණෝත්තර ශ්‍රේණියක n වන පදය $T_n$ විට,

$T_n = ar^{n-1}$ සූත්‍රය මඟින්

ඉතා පහසුවෙන් උත්තරය ලබාගත හැකිව තිබුණි. නමුත් මේ පිළිබඳ පැවති අල්ප දැනුම නිසාවෙන් විවිධ වැරදි උත්තර තෝරා තිබුණි.

1.8 වැල් පොලිය ආශ්‍රිතව සඵල පොලිය සෙවීමේ ගැටළුවකි.

$$\text{EIR} = \{(1+r)^n - 1\}\, 100\%$$

කාර්තුමය (n = 4) පදනම මත සඵල පොලිය අපේක්ෂා කර ඇත. එහිදී නිවැරදි උත්තරය ලෙස (4) තෝරාගත යුතුය.

1.9 කාල ශ්‍රේණි (Time Series) ආශ්‍රිත ගැටළුවකි. දී ඇති කාර්තුවට අදාල උපනති අගය හා කාර්තුමය දර්ශකය දී ඇති විට එම කාර්තුවට අදාල පුරෝකතනය මෙහිදී අපේක්ෂා කර තිබුණි. කාල ශ්‍රේණි පිළිබඳ ඉතා සරල අවබෝධයක් ඇති සිසුවෙකුට පවා මෙවැනි ගැටළුවක් පහසුවෙන් සිදුකළ හැකි වුවත් බොහෝ සිසුන් පිරිසකට කාල ශ්‍රේණි ආශ්‍රිත කිසිදු දැනුමක් නොමැති බැවින් සාර්ථකව උත්තර දීමට නොහැකිව තිබුණි.

1.10 වර්තමාන අගය සෙවීම ආශ්‍රිත ගැටළුවකි.

$$\text{වර්තමාන අගය} = \text{අනාගත අගය} \times \frac{1}{(1+r)^n}$$

සූත්‍රය ආදේශය මගින් පහසුවෙන් වර්තමාන අගය සෙවිය හැකි වුවත් බොහෝ අයදුම්කරුවන් එසේ කර නොතිබුණි.

1.11 සිට 1.15 දක්වා කෙටි උත්තර ලිවිය යුතු ප්‍රශ්න 5 කි.

1.11 වම්පස දී ඇති පද කිහිපයක අර්ථ පැහැදිලි කර දකුණු පස දක්වා ඇති අතර ඒවායේ පිහිටි ස්ථාන වෙනස් කර ඇත. මෙහිදී නිවැරදි පදයට එහි අර්ථය ගැලපිය යුතුව ඇත. මෙහිදී විශේෂත්වය වන්නේ අයදුම්කරුවන් බහුතරයක් පමණ නිවැරදිව උත්තර ලියා තිබීමයි.

1.12 මෙම ප්‍රශ්න පත්‍රයේ අඩුවෙන්ම අයදුම්කරුවන් උත්තර සපයා තිබූ ප්‍රශ්නය මෙයයි. දර්ශකාංකවල සීමාවන් (limitations) අසා තිබූ අතර, සියලුම අයදුම්කරුවන්ට ප්‍රශ්නය පිළිබඳ කිසිදු අවබෝධයක් නොතිබුණි. සමහර අයදුම්කරුවන් ගණිතයේ එන දර්ශක නීති දක්වා තිබීම මගින් මෙය මොනවට පැහැදිලි වේ. අයදුම්කරුවන් බහුතරයකගේ ලකුණු ඉතා අවම මට්ටමක පැවතුණි. .

1.13 කුටිකතා සංගුණකය (Coefficient of Skewness) සෙවීම ආශ්‍රිත ගැටළුවකි. දී ඇති මධ්‍යන්‍ය, මධ්‍යස්ථය හා සම්මත අපගමනය ඇසුරින් කාල් පියර්සන්ගේ කුටිකතා සංගුණකය,

$$\text{කුටිකතා සංගුණකය} = \frac{3(\text{මධ්‍යන්‍යය - මධ්‍යස්ථය})}{\text{සම්මත අපගමනය}}$$

සූත්‍රය භාවිතයෙන් පහසුවෙන් සෙවිය හැකිය. එසේ වුවත් සමහර අයදුම්කරුවන්ට කුටිකතා සංගුණකය සෘණ විය හැක යන්න අමතක කොට ලැබෙන උත්තරයේ සෘණ අගය ධන ලෙස දක්වා තිබුණි.

1.14 සහ 1.15 ප්‍රකාශන දෙක සත්‍ය හෝ අසත්‍යදැයි නිරීක්ෂණය කිරීම මෙහිදී අපේක්ෂා කර තිබුණි. සරල සසම්භාවී නියැදීම සහ විචල්‍ය දෙකක් අතර, සහසම්බන්ධතා පිළිබඳව මෙහිදී ප්‍රකාශ දෙකක් දක්වා තිබුණි.

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක **02**

(a) සමගාමී සමීකරණ දෙක විසඳා අදාල **a** හා **b** විචල්‍ය දෙක සඳහා අගයන් සෙවීම මෙහිදී අපේක්ෂා කර තිබුණි. දී ඇති සමගාමී සමීකරණ දෙකින් එක් විචල්‍යයක් ඉවත්කර, සරල සමීකරණයක් ගෙන එම සමීකරණය විසඳා එමගින් අනිත් විචල්‍ය සොයා ගැනීම මෙහිදී අපේක්ෂා කෙරේ. සමගාමී සමීකරණ විසඳීමේදී සරල සමීකරණයක් ලබාගැනීමට එක් එක් සමීකරණයෙහි විචල්‍ය දෙකේ සංගුණක සමාන කිරීමට හෝ එකක් අනිකේ සෘණ අගය වන පරිදි තැබීමට සමීකරණ අදාල අගයකින් ගුණ කිරීම කළ යුතුය. එසේ වැඩිකර ඒවා අඩුකිරීම හෝ එකතු කිරීම සිදුකිරීමේදී බොහෝ අයදුම්කරුවන් සුළු කිරීමේ දෝෂ සිදුකර තිබුණි. නමුත් අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව මුහුණ දී තිබුණි.

(b) දී ඇති වගන්ති සහිත ප්‍රකාශනය හොඳින් කියවා ඒවා විචල්‍ය දෙකක් හෝ එක් විචල්‍යයක් ඇසුරින් ලියා දක්වා ඒවා විසඳීම මෙහිදී අපේක්ෂා කෙරේ. මෙය ඉතාමත් පහසු ප්‍රශ්නයක් බැවින් බහුතරයක් දෙනා නිවැරදි උත්තරය ලියා තිබුණි.

(c) සමානුපාතික පිළිබඳ සරල ගැටළුවකි. නමුත් සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසා අසාර්ථක විය. දී ඇති වගන්ති සහිත ප්‍රකාශනයෙන් වීජීය සමීකරණයක් නිවැරදිව ලබාගැනීම බොහෝ අයදුම්කරුවන්ට ඉතා අපහසු බව දක්නට ලැබුණි.

සමස්තයක් ලෙස ගත්විට **B කොටසේ** ප්‍රශ්න අතර අයදුම්කරුවන් වැඩිපුරම ලකුණු ලබාගෙන ඇත්තේ 2 වන ප්‍රශ්නයට විය.

## ප්‍රශ්න අංක 03

**(a)** මූල්‍යමය ගණිතය කොටසේ එන මුළු පිරිවැය [Total Cost (TC)] ශ්‍රිතය සහ මුළු ආදායම් [Total Revenue (TR)] ශ්‍රිතය ආශ්‍රිත ගැටළුවකි. පසුගිය ප්‍රශ්න පත්‍ර අධ්‍යයනයේදී මෙවැනි ප්‍රශ්න නිරන්තරයෙන් අසා තිබුණි. මෙහිදී මුළු පිරිවැය = විචල්‍ය පිරිවැය [Variable Cost (VC)] + ස්ථාවර පිරිවැය [Fixed Cost (FC)] සම්බන්ධය ඇසුරින් මුළු පිරිවැය ලබාගත හැක.

මුළු ආදායම් ශ්‍රිතය = මාසික ඉල්ලුම x මසකට ඒකක ගණන

TR = P + q

මෙහිදී P = (400-q) නිසා TR = P x q ලබා ගැනීමේදී අයදුම්කරුවන් බහුතරයක් විසින් TR = 400 - q x q ලෙස වරහන් ඉවත් කර තිබීම ඉතා කණගාටුදායක තත්ත්වයකි. ද්වි පදය සුළු කිරීමේදී වරහනක් යෙදීම සම්බන්ධයෙන් අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය.

සමච්ඡේදන ලක්ෂ්‍යය සඳහා TC = TR වන ලක්ෂ්‍යය සෙවිය යුතුය. එහිදී ගණිතමය සමීකරණ සුළු කිරීමේදී සැලකිල්ලකින් සුළු කිරීම් සිදුකර නොතිබුණි.

**(b)** මුළු පිරිවැය ශ්‍රිතය (Total Cost Function) දී ඇති විට පිරිවැය අවම වන ඒකක ප්‍රමාණය ගණනය කිරීම අපේක්ෂා කරයි. TC ශ්‍රිතය q විශයයෙන් අවකලනය කර,

$$\frac{d\,(TC)}{dq} = 0$$

වන q හි අගයන් ලබාගෙන පළමු ව්‍යුත්පන්න පරික්ෂාව අනුව TC උපරිම වන q අගය ලබාගත හැක. මෙහිදී අයදුම්කරුවන් නිවැරදිව අවකලනය කිරීමට දුර්වල බවක් දක්නට ලැබුණි. Q දී ඇත්තේ දහස් ('000) ඒවා වලින් නිසා q සඳහා ලැබෙන අගය 1,000 q ගුණ කිරීමට බොහෝ දෙනෙක් අමතක කර තිබුණි. තවද මෙම TC ශ්‍රිතය වර්ගපූරණය කර එමගින් TC උපරිම වන q අගය වීජීයවද ලබාගත හැක.

## ප්‍රශ්න අංක 04

විචල්‍ය දෙකක් අතර සහසම්බන්ධතාව දක්වන අඩුතම වර්ග ප්‍රතිපායන රේඛාව ආශ්‍රිත ගැටළුවකි. දී ඇති වගුව ඇසුරින් $\sum xy$ සහ $\sum x^2$ ලබාගන්න.

$$b = \frac{n\sum xy - \sum x \sum y}{n\sum x^2 - (\sum x)^2}$$ සූත්‍රයෙන් b ලබාගෙන $a = \overline{y} - b\overline{x}$ සූත්‍රය භාවිතයෙන් a ලබාගන්න.

ප්‍රතිපායන රේඛාවේ සමීකරණය, $y = a + bx$ ලෙස දැක්වීම කළ යුතු වුවත් අයදුම්කරුවන් අතරින් ඉතා අඩු පිරිසක් a සහ b නිවැරදිව ගෙන ප්‍රතිපායන රේඛාව $y = a + bx$ ලබාගෙන තිබුණි.

$y = a + bx$ සමීකරණයෙහි $x$ 1,000 ඒවා වලින් දැක්විය යුතු නිසා (b) කොටසේදී $x = 800$ ලෙස ආදේශ කළ යුතු වුවත් අයදුම්කරුවන් විශාල පිරිසක් 800,000 ලෙස යොදා තිබීම නිසා ලකුණු අඩු විය.

## ප්‍රශ්න අංක 05

දී ඇති සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තිය ඇසුරින් කේන්ද්‍රගත ප්‍රවණතා මිනුම් වන මාතය හා මධ්‍යන්‍යයත් අපකිරණයේ මිනුමක් වන සම්මත අපගමනයත් නිර්ණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. මාතය ගණනය කිරීමේදී ප්‍රථමයෙන් මාත පන්තියේ පන්ති මායිමක් ලෙස (49.5 - 59.5) ගත යුතුය.

<u>මාතය:</u> සමූහිත දත්ත සඳහා : $M_0 = L_1 + \frac{\Delta_1}{\Delta_1 + \Delta_2} \times C$ සූත්‍රය ඇසුරෙන් මාතය සඳහා දළ අගයක් ලබාගත හැකිය.

බොහෝ අයදුම්කරුවන් පිරිසක් ඉහත සූත්‍රය නිවැරදිව ආදේශ කර මාතය ගණනය කිරීමට පුරුදුව නොමැති බව දක්නට ලැබුණි. මධ්‍යන්‍යය ගණනය කිරීමේදී පන්ති ලකුණ හෙවත් මධ්‍ය අගය නිවැරදිව ගණනය කර නොමැති වීමෙන් සම්පූර්ණයෙන් අසාර්ථක වී ඇත.

## C කොටස

### ප්‍රශ්න අංක 06

මුළු ලකුණු 20 ක් හිමිවන මෙම ප්‍රශ්නය කොටස් 4 කින් සමන්විත විය.

(A) කොටසේ අසා ඇත්තේ වාර්ෂික වාරිකයක අගය ගණනය කිරීමය. දී ඇති සූත්‍ර පත්‍රිකාව අනුව

$$A = \frac{SR^n(R-1)}{\{R^n - 1\}}$$ A සෙවිය හැක.

කෙසේනමුත් නිවැරදි සූත්‍රය හඳුනා නොගැනීම, සූත්‍රය සඳහා නිවැරදි දත්ත යොදා නොගැනීම සහ සුළු කිරීම්වල ඇති විවිධ අඩුපාඩු හේතුවෙන් නිවැරදි උත්තරය ලබා ගැනීමට බහුතරයක් අයදුම්කරුවන්ට නොහැකි විය.

(B) සමාගම් දෙකක ව්‍යාපෘති දෙකක මුදල් ගලාප්ම දක්වා ඇති අතර, අදාල වට්ටම් සාධකය යටතේ ශුද්ධ වර්තමාන අගය [Net Present Value (NPV)] සොයාගෙන එම අගයන් අනුව වඩාත් හොඳ ආයෝජනය හඳුනා ගැනීම මෙහිදී අපේක්ෂා කරයි.

සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව NPV අගය ලබාගත්තත් එම අගයන් සන්සන්දනය කර වැඩිම අගය ඇති ව්‍යාපෘතිය වඩාත් හොඳ බවට තෝරාගැනීමට අපහසු වී තිබුණි.

(C) සම්භාවිතාවේ අර්ථ දක්වීම අනුව දී ඇති දත්ත වගුවෙන් සම්භාවිතා ගණනය කිරීම අපේක්ෂා කර ඇත.

(a) කොටස සඳහා ඉතා පහසුවෙන් අයදුම්කරුවන් නිවැරදි උත්තරය ලබාගෙන තිබුණි.

(b) කොටස සඳහා අසම්භාවී සම්භාවිතාව ආශ්‍රිත ගැටළුවකි. අයදුම්කරුවන් අසම්භාවී සම්භාවිතාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතුය.

(D) (a) දී ඇති විවික්ත සසම්භාවී ව්‍යාප්තිය ඇසුරෙන් අපේක්ෂිත අගය (expected value) සෙවීම මෙහිදී අවශ්‍යව ඇත. අපේක්ෂිත අගයේ අර්ථ දැක්වීම අනුව,

$$E(x) = \frac{\sum_{i}^{n}}{\sum f} \quad xP(x - x_i)$$

ඉතා පහසුවෙන් ගණනය කළ හැකි වුවත් සමහර අයදුම්කරුවන් 0 x 0.125 සුළු කර 0.125 ලෙස දක්වා තිබුණි.

සමහර අයදුම්කරුවන්

$$E(x) = \frac{\sum_{i}^{n}}{\sum f} \quad x_i\, P(x - x_i)$$ යනුවෙන් වැරදි ලෙස සුළු කිරීම ඉතා කණගාටුදායකය.

නිවැරදිව $\sum$ අංකනය භාවිත කිරීමට අයදුම්කරුවන් මීට වඩා පුහුණු විය යුතුය.

**(b)** ප්‍රමත ව්‍යාප්තිය ආශ්‍රිත ගටළුවකි. x = මාලුවෙකුගේ බර නම්,

$X \propto N(7.5, 1.8^2)$

$$P(X > 10) = P\left(\frac{(X - M)}{\sigma} > \frac{(10 - 7.5)}{1.8}\right)$$

$$= P(Z > 1.39)$$

Z අගය නිවැරදිව ගණනය කර තිබුණත් සමහර අයදුම්කරුවන් ප්‍රමත වගුව භාවිතයෙන් අදාල නිවැරදි සම්භාවිතා අගය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

මෙහිදී දී ඇති ව්‍යාප්තිය ඇසුරෙන් Z අගය නිවැරදිව ලබාගෙන නිවැරදි සම්භාවිතාව ගණනය කිරීමට අයදුම්කරුවන් පුරුදු පුහුණු විය යුතුය.

--------

<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

(2) අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

(3) සූත්‍ර පිටපත් කිරීමේදී සහ සූත්‍ර වලට ආදේශ කිරීමේදී සැලකිලිමත් විය යුතුය. සමහර ප්‍රශ්න සඳහා උත්තර සැපයීමේදී සූත්‍ර කීපයක්ම යොදාගත හැකි අතර ඉන් වඩාත්ම පහසු සූත්‍රය යොදා ගැනීම. තවද සූත්‍ර පත්‍රිකාවෙන් සූත්‍ර පිටපත් කිරීමේදී "+" හා "-" ලකුණු මාරු නොකර සටහන් කර ගැනීමට වගබලාගත යුතුය.

(4) සමහර සූත්‍ර මගින් විසඳිය යුතු ප්‍රශ්න වලදී අයදුම්කරුවන් සූත්‍රය ලියා අගයන් ආදේශ කිරීම නොපෙන්වා ගණක යන්ත්‍රය මගින් අවසන් උත්තරය පමණක් ලබාගෙන සටහන් කර තිබුණි. නමුත් අයදුම්කරුවන් සූත්‍රය ලියා එයට නිවැරදි අගයන් ආදේශ කර උත්තරය ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම යෝග්‍ය වේ. මෙහිදී අවසාන උත්තරය නිවැරදි නොවන අවස්ථාවලදී අදාල පියවරයන්වලට ලකුණු ලබාගැනීමට හැකියාව පවතී.

(5) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(7) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(8) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(9) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(10) එක් ප්‍රශ්නයක උත්තරය අවසානයේ ඊළඟ ප්‍රශ්නය අලුත් පිටුවකින් ආරම්භ නොකර, පෙර පිටුවේ ඉතා කුඩා ඉඩක අලුත් ප්‍රශ්නය ආරම්භ කළ අවස්ථා බොහෝ තිබුණි. සෑමවිටම අළුත් ප්‍රශ්නයක් අළුත් පිටුවකින් ආරම්භ කිරීමට අයදුම්කරුවන් වගබලා ගත යුතුය.

(11) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -